සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

# දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2015
## Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I | කාලය / காலம் / Time: පැය 01 |

සැළකිය යුතුයි : (1) 1 සිට 40 දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.
(2) ඔබට දී ඇති පිළිතුරු පත්‍රයේ එම ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුරෙහි (x) ලකුණ යොදන්න.
(3) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(01) අපගේ ක්‍රියාවන් සියල්ල අල්ලාහ් නිරීක්ෂණය කරන්නකු ලෙස සිටියි යන අර්ථය ගෙන දෙන අල්ලාහ්ගේ ගුණ නාමය වන්නේ,
(1) අල් වදූද් (2) අල් බසීර් (3) අල් අලීම් (4) අර් රකීබ්

(02) "සුළු කිල්ල" යන්න ඔබ වටහා ගන්නේ කෙසේ ද?
(1) ස්නානය නොකර සිටීම. (2) අපිරිසිදුව සිටීම.
(3) වුළු : නොමැතිව සිටීම. (4) හයිල් සහිතව සිටීම.

(03) සලාතයේ දී දකුණු පාදයෙහි ඇඟිලි තුඩු පොළොවේ වැදෙන සේ සිටුවා තබා, වම් පාදයේ යටි පාදය මත හිඳ ගන්නා ඉරියව්ව,
(1) ඉෆ්තිරාෂ් (2) තවර්රුක් (3) ඉස්තිස්බාත් (4) ඉතිදාල්

(04) සලාතයේ යෙදීම තහනම් කරන ලද අයියාමුත්-තෂ්රීක් යන දින තුන වන්නේ දුල් හජ් මස,
(1) 10, 11, 12 (2) 11, 12, 13 (3)12, 13, 14 (4) 13, 14, 15

(05) එක් හදීස් දැනුම් දීමකට අනුව පිළිගත්එක් හාජිවරයකුට පරලොවදී අන් අය වෙනුවෙන් නිර්දේශ කළ හැකි පුද්ගල සංඛ්‍යාව,
(1) දස දෙනෙකි (2) විසිදෙනෙකි. (3) තිස්දෙනෙකි. (4) හතළිස් දෙනෙකි.

(06) නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ් ව පිළිපැද සිටීම,
(1) ඉත්තිබාඋ (2) ඉජ්තිමාඋ (3) ඉස්තිරාහත් (4) ඉජ්තිහද්

(07) "මගෙන් පසු ව මාගේ සමාජයෙන් බොරුකාරයින් වන දජ්ජාල්වරුන් බිහි, ඔවුන් එකිනෙකා තමා නබිවරයා යයි තර්ක කරති." යන කියමනට අදාළ සංඛ්‍යාව වන්නේ,
(1) හැත්තෑවකි. (2) හතළිහකි. (3) තිහකි. (4) විස්සකි.

(08) ආයතුල් කුද්සි හි ඇති වාක්‍ය ගණන වන්නේ,
(1) එකකි. (2) තුනකි. (3) පහකි. (4) හතකි.

(09) වයෝවෘද්ධිය, ශක්තිය නොමැති අය හාස්ත්‍රීන් ආදී තුන් පිරිස ඉටු කරන "ජිහාද්" ලෙස සලකනු ලබන්නේ,
(1) උම්රා (2) හජ් (3) ඉජ්තිහාද් (4) ඉවසීම.

(10) අපගේ පාපයන් සඳහා අප අල්ලාහ්ගෙන් පව්කමා ඉල්ලීමෙන් අල්ලාහ් අපට,
(1) අඛණ්ඩව වැසි ලබා දෙයි. (2) ධනය ලබා දෙයි.
(3) පව් කමා කරයි. (4) ඉහත කී සියල්ල ලබාදෙයි.

(11) විවාහක භාර්යාවක් අයත් වන්නේ පහත කුමන තත්වයේ ද?
(1) අජ්නබි වේ. (2) මහ්රම් වේ.
(3) තවකාලික මහ්රම් වේ. (4) ලේ සබඳතා ඇති මහ්රම් වේ.

(12) බහු විවාහ ක්‍රමය ඉස්ලාමයේ හඳුන්වා දුන් වසර,
(1) හිජ්රි - 4 (2) හිජ්රි - 3 (3) හිජ්රි - 2 (4) හිජ්රි - 1

(13) ෆික්හුල් උස්රා මගින් අප දැනගන්නේ,
(1) විවාහ ජීවිතය (2) පවුල් ජීවිතය
(3) වෙළඳාම පිළිබඳ නීතිරීති (4) ආර්ථිකය පිළිබඳ නීති

(14) "අල් බයිනුනහ් සුහ්රා" යන්නේ අප අදහස් කරන්නේ,
(1) ඒක තලාකයකින් පසු ඉද්දා අවසන් වීමට පෙර බිරිඳගෙන් වෙන්වීම.
(2) තලාක් දෙකක් පවසා ඉද්දා අවසන් වීමට පෙර බිරිඳගෙන් වෙන්වීම.
(3) තලාක් තුනක් පවසා අවසන් වූ පසු බිරිඳගෙන් වෙස් වීම.
(4) තලාක් තුනක් පැවසූ පසු බිරිඳගෙන් වෙන් නොවන තත්ත්වය.

(15) ඉස්ලාමීය අකීදා හි මෙළොවට හා ඉන්ද්‍රියයන්ට ගෝචර නොවන අංගයන් අඩංගු අංගය,
(1) අස් - සම්ඉයියාත් (2) අර් - රූහානියියාත්
(3) අල් - ඉලාහියියාත් (4) අන් - නුබුව්වත්

(16) අන් අය අපට උදවු කතර විට අප ජzසාකල්ලාහ් කයිරායයි පවසමු. මෙහි අරුත වන්නේ,
(1) අල්ලාහ් ඔබට දයා වඩක්වත්වා ! (2) අල්ලාහ් අපට කෘතගුණ දක්වත්වා !
(3) අල්ලාහ් ඔබට කුලිය ලබා දෙත්වා ! (4) අල්ලාහ් ඔබට යහපත ලබා දෙත්වා !

(17) ගවයින් පනස් පස් දෙනෙකු ඇති කෙනෙක් Zසකාත් ලෙස දිය යුතු ප්‍රමාණය වන්නේ,
(1) වසරක් සම්පූර්ණ වූ වස්සෙක් (2) වසර දෙකක් සම්පූර්ණ වූ වස්සෙක්
(3) වසරක් සම්පූර්ණ වූ ගවයන් (4) වසර දෙකක් සම්පූර්ණ වූ ගවයෙක්.

(18) උදෑසන 7.00 ට ගමන ආරම්භ කර අක්කරෙයි පත්තුවට යන කෙනෙකු තම ලුහර් සලාතිය අසර් සලාතය සමග කිරීමට නියත් තබා ගත්තේ ය. මෙම ක්‍රමය,
(1) ජම්උ (2) කස්ර් (3) ජම්උ තක්දීම් (4) ජම්උ තෑහීර්

(19) Zසකාත් දීම ප්‍රතික්ෂේප කළ අය සමග සටන් කිරීමට සූදානම් වූයේ.
(1) අබු බක්කර් (රලි) (2) උමර් (රලි)
(3) මුආවියා (රලි) (4) කලීෆා හාරූන් අල් රෂීද්

(20) කි.ගැ. 692.5 ට අධිකව ධාන්‍ය ඇති අයෙක්, Zසකාත් ලෙස,
(1) ධාන්‍ය වලින්ම දිය යුතුය.
(2) එහි අගය මුදලින් දිය යුතුය.
(3) මුදලින් හෝ ධාන්‍යවලින් හෝ දිය යුතුය.
(4) ඔවුන්ට සකාත් අනිවාර්ය නොවන බැවින් නොදිය යුතුය.

(21) "ආත්මයන් මිනිසාගෙන් වෙන් වී ගිය ද ඒවා විනාශ වන්නේ නැත" යන අදහස දරන්නන්,
(1) සුන්නත් වල් ජමාඅත් වරුන් (2) මුඃතසිලාවරුන්
(3) ෂියාවරුන් (4) ජබරියාවරුන්

(22) තම තරුණ කාලය පුණ්‍ය ක්‍රියා වෙනුවෙන් ගත කළ කෙනෙකුට පරලොවෙහි අල්ලාහ් ලබාදෙන විශේෂ වරප්‍රසාදය,
(1) ප්‍රශ්න විචාරයෙන් තොරව ස්වර්ගයට යාම.
(2) පින් පව් සඳහන් කළ පොත දකුණු අතට හිමි වීම.
(3) අර්ෂ් හි සෙවන ලැබීම.
(4) අත් පා හා මුහුණ දීප්තිමත් වීම.

(23) "නබි (සල්) තුමාණන් කෙනෙකුගේ ජනාසා සලාතය කළ නොහැකිය" යයි පවසා පසු බැසීමට ලක් වූ මිය ගිය තැනැත්තාගේ ක්‍රියාව වන්නේ,
(1) අසත්‍ය දිවුරුම (2) පොළිය (3) ණය (4) ගැටළු ඇති කිරීම.

(24) මිනිසකු දිනපතා නබි (සල්) වෙනුවෙන් සලවාත් පැවසිය යුතු අවම සංඛ්‍යාව වන්නේ,
(1) දහයකි. (2) පහකි. (3) දහ හතකි. (4) සීයකි.

(25) ඉස්ලාමීය දණ්ඩන ක්‍රමයෙහි "තෑසීර්" යන්නෙන් අදහස් කරන්නේ,
(1) අල්ලාහ් හා නබිතුමා මගින් සීමා කරන ලද දඬුවම. (2) ඉස්ලාමීය දඬුවම.
(3) ඉජ්තිහාද් ක්‍රමයෙන් දෙන දඬුවම. (4) විනිශ්චයකරු විසින් දෙනු ලබන දඬුවම.

(26) හවුල් ව්‍යාපාරවල නීතිරීති අතරින් එකකි,
(1) ලාභ අලාභ බෙදන ආකාරය කල් ඇතිව තීරණය කර තිබීම.
(2) ලාභ අලාභ ප්‍රමාණය තීරණය කර තිබීම.
(3) ලාභ අලාභ සඳහා සේවකයින් ද දායක කර ගැනීම.
(4) එක් අයකුගේ ඉපයීම ද තවත් අයකුගේ ප්‍රාග්ධනය ද අඩංගු වී තිබීම.

(27) හදිසි අවස්ථාවක දී තම නිවසේ ඔප්පුව ඉදිරිපත් කර බයිතුල් මාල් මගින් ණයක් ලබා ගන්නා ලදී. මෙම ක්‍රමය හඳුන්වන්නේ,
(1) ණය ක්‍රමය (2) උකස් ක්‍රමය (3) විශ්වාසනීය ණය (4) වසියත්

(28) "මුරාබහා" යනු
(1) ව්‍යාපාර ක්‍රමයකි.
(2) ණය ක්‍රමයකි.
(3) දඬුවම් ක්‍රමයකි.
(4) විවාහ ක්‍රමයකි.

(29) නබි මූසා (අලෛ) තුමාව තම වත්තේ සේවය කිරීම සඳහා කුලියට යෙද වූ නබි වරයා වන්නේ,
(1) අයියූබ් (අලෛ) තුමා
(2) zසකරියා (අලෛ) තුමා
(3) ඉල්යාස් (අලෛ) තුමා
(4) ශුහෙයිබ් (අලෛ) තුමා

* ප්‍රශ්න අංක 30 - 37 දක්වා වූ ප්‍රශ්න සඳහා පහත සිද්ධිය ඇසුරින් පිළිතුරු සපයන්න.

මිනිසා පරිත්‍යාග කිරීමේ උසස් ගුණය ඇත්තකු නිසා ඔහු තම මරණයට පෙර, තම කෝටි තුනක් වටිනා වස්තුවෙන් එක් කොටසක් දන් දෙන ලෙස ද, ඉතිරි සියල්ල තම පවුලේ සාමාජිකයන් අතර බෙදා දෙන ලෙස ද ලියා මිය ගියේ ය. මෙහි,

(30) දන් දීම යන අදහසෙහි අර්ථය,
(1) හදියා (2) හිබත් (3) සදතකුල් ජාරියා (4) සදකා

(31) උසස් ගුණය ඇත්තෙති යන අදහස ගෙන දෙන පදය,
(1) හුලුකුන් (2) අදබුන් (3) අඛ්ලාක් (4) හුලුකුල් හසන්

(32) දන් දෙන ලෙසට එම පුද්ගලයා පැවසීම හෝ ලිවීම,
(1) වකුෆ් වේ. (2) වසීයත් වේ. (3) වරාසත් වේ. (4) වකාලා වේ.

(33) එම පුද්ලයාට ඔහුගේ මුළු වස්තුවේන දන් දිය හැකි වැඩිම ප්‍රමාණය වන්නේ,
(1) එක් ලක්ෂයක් (2) දස ලක්ෂයක් (3) ලක්ෂ පනහක් (4) කෝටි එකක්

(34) එම පුද්ගලයාගේ බෙදා දෙන ලද ඉතිරි වස්තුන් මෙලෙස හඳුන්වනු ලැබේ.
(1) වරාසත් (2) මාලියාත් (3) අස්-සබා (4) රිබා

(35) මෙම දේපල බෙදා දිය යුතු උරුමක්කරුවන්ගේ කොටස් සංඛ්‍යාව වන්නේ,
(1) දෙකකි. (2) තුනකි. (3) හතරකි. (4) හතකි.

(36) මෙම පුද්ගලයා මිය ගිය පසු ඔහුගේ දේපළවලින් කළ යුතු මුල්ම කාර්යය වන්නේ,
(1) පවුලේ උරුමක්කරුවන්ට බෙදා දීම.
(2) කපන් කිරීමේ අවශ්‍යතා ඉටු කිරීම.
(3) අන්තිම කැමති පත්‍රයේ සඳහන් දේ ඉටු කිරීම.
(4) ණය ගෙවා නිම කිරීම.

(37) මෙම පුද්ගලයාගේ දේපල උරුමය ලැබිය යුතු මුල්ම කණ්ඩායම වන්නේ,
(1) අල් අර්හාම් (2) අල්වසීයියු (3) අස්හාබුල් ෆුරූල් (4) අල් අසබා

(38) තම අශ්වයාව යුද්ධමය අවශ්‍යතා සඳහා වකුෆ් කළ තැනැත්තා වන්නේ,
(1) උස්මාන් (රලි) තුමා
(2) උමර් (රලි) තුමා
(3) අබ්දුල් රහ්මාන් ඉබ්නු අව්ෆ් (රලි) තුමා
(4) සල්මානුල් ෆාරිස් (රලි) තුමා

(39) මුහද්දිසීන්වරු යනු,
(1) නවීන ගැටළු සඳහා විසඳුම් ලබා දෙන්නන්.
(2)අල්-කුර්ආනයට අර්ථ විවරණය ලබාදෙන විද්වතුන්
(3) අල් හදීස් ක්ෂෙත්‍රයේ විද්වතුන්
(4) මුස්ලිම්වරුන්ගේ දැනුම පිළිබඳ දායක වූ අය

(40) හදිස් 4000 ක් එක් රැස්කර ගොනු කරන ලද හදිස් ග්‍රන්ථය,
(1) බුහාරි, සුනන් ඉබ්නු මාජාහ්
(2) මුස්ලිම්, සුනන් අබු දාවුද්
(3) සුනන් ඉබ්නු මාජාහ්, මුස්ලිම්
(4) ජාමිඋල් කුර්ආන්, සුනන් නසාර්

1639

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
**Western Province Education Department - Colombo Educational Zone**

# දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
**Second Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

උපදෙස්

- පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරක් වන ලෙසට ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් ද , සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) කෙටියෙන් පිළිතුරු ලියන්න.

(i) ව්‍යාජ නබිවරු දෙදෙනකු නම් කරන්න.
(ii) ඍජු මාර්ගය ලැබීම සඳහා අප දිනපතා සලාත් කිරීමේ දී ඉල්ලා සිටින වාක්‍යය කුමක් ද?
(iii) හදීසුල් කුද්සි යනු කුමක් ද?
(iv) තරුණ කාලයේ සිටින ස්ත්‍රීන් හා පුරුෂයින්, ඔවුන්ගේ ක්‍රියාව පදනම් කරගෙන කොටස් දෙකකට වෙන් කෙරේ. එම කොටස් දෙක නම් කරන්න.
(v) මහ්රම්, අජ්නබි යන කොටස් දෙක වෙන් කර පහදන්න.
(vi) පරලොව දී අපගේ ප්‍රශ්න විචාරය සිදු කරන ලෙස ඉල්ලා නබි (සල්) තුමාණන් අල්ලාහ් තආලාගෙන් ඉල්ලා සිටන නිර්දේශය හඳුන්වන්නේ කෙසේ ද?
(vii) අල් කුර්ආනය ආශ්චර්යවත් ආගමක් යන්නට උදාහරණ දෙකක් ලියන්න.
(viii) උල්හියා සඳහා ඉතා සුදුසු උසස් ම කාලය කුමක් ද?
(ix) ඝාතනයට ලක් වූ තැනැත්තකුගේ පවුලේ උදව්යට ලබා දෙන වන්දි මුදල හෝ වස්තුව හඳුන්වන්නේ කුමන නමකින් ද?
(x) මුනාකහාත්, මුආමලාත් යන පද දෙක වෙන් කර පහදන්න.

(02) (i) පස් වෙල සාලතය නියමිත කාලයට කළ යුතුය යන්න පවසන අල් කුර්ආන් වාක්‍යය කුමක් ද?
(ii) සලාතය අතහැරීම මහා පාපයක් වන්නේ ඇයි?
(iii) "සලාතය ජමාඅත් ලෙස ඉටු කිරීම ඉතා වැදගත් සුන්නතයකි" යන්න පහදන්න.

(03) (i) කිසිවිටක නොකළ යුතු මහා පාප කර්ම 4 ක් නම් කරන්න.
(ii) තම්බා කරන විට පිළිපැදිය යුතු කොන්දේසි 3ක් ලියන්න.
(iii) ආදරය දැක්විය යුතු ආකාර කිහිපයකි. ඒවා පෙළගස්වන්න.

(04) (i) ස්ථිර මහ්රම් වර්ග දෙකක් නිදසුන් සහිතව නම් කරන්න.
(ii) තලාක් හි වර්ග 2 නිදසුන් සහිතව පහදන්න.
(iii) ඉද්දාහි වර්ග නම් කර, ඉද්දා සිටින විට නොකළ යුතු ක්‍රියාවන් නම් කරන්න.

(05) (i) හුකුකුල් ඉබාද් පිළිබඳ කෙටියෙන් පහදන්න.
(ii) දිව සුරැකීම, ඇත්ත කතා කිරීම, අහංකාරය යන ගුණාංගවල වැදගත් ලක්ෂණ ලියන්න.
(iii) වෙළඳාමේ මූලික ලක්ෂණ නම් කර, එයින් දෙකක් කෙටියෙන් පහදන්න.

(06) (i) රත්‍රන් හා රිදී සඳහා වූ zසකාත්වල නිසාබ් ප්‍රමාණය කොපමණ ද?
(ii) zසකාත්හි ප්‍රයෝජන ලියන්න.
(iii) හජ් කරන ආකාරය කෙටියෙන් ලියන්න.

(07) (i) හදීස් හා සුන්නා යන වර්ග දෙක වෙන්කර පහදන්න.
(ii) හදීස් හි වර්ග තුන නිදසුන් සහිතව ලියන්න.
(iii) හදීස් එක්රැස් කිරීමේ ඉතිහාසය කෙටියෙන් පහදන්න.